**පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2020**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ  මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති  විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 08 ඡේදය ප්‍රකාරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨයට අයත් පුරාවිද්‍යා කෞතුකාගාරයේ සහ ප්‍රධාන පුස්තකාලය සතුව පවතින ප්‍රවේණිගත වත්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | කලා පීඨයට අයත් පුරාවිද්‍යා කෞතුකාගාරයේ සහ ප්‍රධාන පුස්තකාලය සතුව පවතින ප්‍රවේණිගත වත්කම් හඳුනාගෙන, රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 08 ඡේදය ප්‍රකාරව ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම 2021 වර්ෂයේ දී සිදු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සඳහා වන ගිණුම්කරණ සටහන් අංක 1.3.6.9 ට අනුව විශ්වවිද්‍යාලයට අයත් මාවලවත්ත පිහිටි ඉඩමේ අක්කර 07 යි රූඩ් 02 ක භූමි ප්‍රමාණයක් ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර ඇති බවට දක්වා තිබුණද, එම ඉඩම් ප්‍රමාණයෙහි වටිනාකම හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය | අක්කර 07, රූඩ් 02 විශාලත්වයකින් යුතු මාවලවත්ත ඉඩම් කොටස අනවසර පදිංචිකරුවන්ට නිත්‍යානුකූලව ලබාදීම සඳහා එම ඉඩමේ භුක්තිය ගහවට කෝරළය ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී ඇතත්, ඉඩමේ අයිතිය පවරා දී නොමැති බවත්, එබැවින් එකී ඉඩම වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇත. | විශ්වවිද්‍යාලයට අයත් දේපල නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ පිහිටි පර්චස් 40 ක පමණ ඉඩම 1987 දෙසැම්බර් 31 දින සිට 2017 දෙසැම්බර් 30 දින දක්වා වසර 30 ක බදු පදනම මත දිවිනැගුම දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර ඒ සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.7,200,000 ක හිඟ බදු මුදල හා 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලැබිය යුතු බදු මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතු හිඟ බදු මුදල රුපියල් 6,580,000 ක් වූවද, එම මුදල් ගෙවීම දිවිනැගුම දෙපාර්තමේන්තුව මඟින් පැහැර හැර ඇත. දිවිනැගුම දෙපාර්තමේන්තුවට එම භූමියේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 11.56 පමණ වැය වී ඇති බව දන්වා ඇති අතර එම මුදලින් විශ්වවිද්‍යාලයට අයවිය යුතු හිඟ මුදල් අඩු කර ඉතිරි මුදල්වලට අදාළව එම දෙපාර්තමේන්තුව තවත් ඉදිරි කාලයක් පවත්වාගෙන යාමට ඉල්ලීම් කර ඇත. මේ හේතුවෙන් විශ්වවිද්‍යාලය වෙත බදු මුදල් ගෙවීමට කටයුතු කර නොමැත. එම දේපල සම්පූර්ණ භුක්තිය විශ්වවිද්‍යාලය සතු කර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු දැනට සිදු කෙරෙමින් පවතින බැවින් 2017 වසරේ සිට මේ දක්වා නැවත ඔවුන් වෙත ගොඩනැගිලි කොටස් බදු ලෙස ලබා දීමට කටයුතු කර නොමැත. | අයවිය යුතු ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු. 12,400,466 ක් වූ ආයෝජන පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඇති ස්ථාවර තැන්පතු 7 ක වර්ෂයට අදාළ පොලී මුදල ගිණුම් වර්ෂයට පසුව චෙක්පත් මඟින් විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇති බැවින් ලැබිය යුතු පොලිය ලෙස ගිණුම්ගත කර ඇත. | වර්ෂයට අදාළ ආයෝජන පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වල බැර ශේෂ පැවතිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ගිණුම් 03 කට අදාළව එකතුව රු.169,665,787 ක් වූ අසමාන්‍ය හර ශේෂ පැවතුණි. | එක් එක් ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් පරිදි රජයේ ප්‍රතිපාදන නොලැබීම මත වැඩි පුර මුදල් ශේෂ ඇති ව්‍යාපෘතිවලින් මුදල් කමිටුවේ අනුමැතිය මත මුදල් ශේෂ මාරු කිරීමට සිදු වන ලදි. තවද එම බොහෝමයක් ව්‍යාපෘති මේ වන විට අවසන් වී ඇත. | ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘතිවලට පමණක් වියදම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය පවත්වාගෙන යනු ලබන අක්කර 17.31 ක වපසරියකින් යුත් ඉඩම විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් අදාළ ඉඩම විශ්වවිද්‍යාලය වෙත පවරා දීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශනවලට ගැලපුම් කිරීමට කටයුතු කරන බව | ගිණුම්කරණ සංකල්ප රීති සහ මූලධර්මවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කළ යුතු පුනරුත්තාපන හා ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට අදාළව 2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා දරන ලද එකතුව රු.86,414,169ක වියදම් කෙරීගෙන යන වැඩ (Working Progress) යටතේ අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | මෙම ව්‍යාපෘති විවිධ හේතූන් මත ප්‍රාග්ධනිත කිරීමට නොහැකි වී තිබුණු බවත් කෙසේ වෙතත් මෙම සියලු ව්‍යාපෘතීන් 2021 වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව | ඉදිකිරීම් නිමකර භාවිතයට ගනු ලබන වත්කම් නිවැරදිව හඳුනාගෙන ප්‍රාග්ධනිත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැඳුම්කර සහ ගිවිසුම කඩ කරන ලද ආචාර්යවරුන් 116 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.144,240,849 ක මුදලක් අයවීමට තිබුණි. මේ නිලධාරීන් බැඳුම්කර සහ ගිවිසුම් කඩ කර වර්ෂ 01 සිට වසර 50 දක්වා කාලයක් ගතවී ඇතත්, එම ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කර නොතිබුණි. | ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන්ගෙන් 66 දෙනෙකු ඉතා පැරණි බැඳුම්කර කඩ කරන ලද ආචාර්යවරුන් වන අතර ඉන් 04 දෙනෙකු ඔවුන්ගේ බැඳුම්කර වටිනාකම් තම අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කැමැත්ත ලබාදී ඇති නමුදු ලිපිගොනුවල පවතින අඩුපාඩු හේතුවෙන් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමේ කටයුතු අඩාලව පවතී. ඉතා පැරණි ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් සම්බන්ධයෙන් කල් ඉකුත්වීම හේතු කොටගෙන නීති ක්‍රියාමාර්ග ගත නොහැකි තත්ත්වයක පවතින බැවින් සහ විකල්ප ක්‍රියාමාර්ගද නොමැති බැවින් මේ පිළිබඳ කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් තීරණයක් | බැඳුම්කර සහ ගිවිසුම් කඩ කරන ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් 2021 අප්‍රේල් 24 දිනැති ලිපිය මගින් කමිටුවක් පත් කොට ඇත. | |
| (ආ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු රු.400,000 ක රක්ෂණ වන්දි මුදලක් වසර 08 කට අධික කාලයක් ගතවී තිබුණත්, අයකර ගෙන නොතිබුණි. | මෙම රථයේ මුක්තාවශේෂ රක්ෂණ සමාගම වෙත ලබාදී විශ්වවිද්‍යාලය වෙත ලැබිය යුතු රු.400,000 මුදල ලබා ගැනීමට කටයුතු කරමින් ඇත. | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) විශ්වවිද්‍යාලයේ පීඨ 09 කින් 1980 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළව අයවිය යුතු රු.4,996,292 ක් වූ ශාලා ගාස්තු හා දඩ මුදල් වසර 03 සිට වසර 39 දක්වා කාලයක් ගතවී තිබුණද, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට රු.4,996,292 ක් වූ ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල්වලින් රු.173,588 ක මුළු මුදලක් මේ වන විට ලැබී ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇත. | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ වැටුප් නතර කර ඇති නිලධාරීන් 13 දෙනකුගෙන් අයවිය යුතු රු.1,355,275 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක්ම අය කර නොතිබුණි. | මෙම නිලධාරීන්ගේ ණය ශේෂ අර්ථසාධක අරමුදලින් සහ බැඳුම්කරවලින් අය කර ගැනීමට අවශ්‍ය අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇත. | ලැබිය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) විශ්වවිද්‍යාලයට අයත් දේපල බාහිර පාර්ශවයන් විසින් පරිහරණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.2,908,359 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අයවිය යුතු මුදලින් සමහර ව්‍යාපෘතිවල බදු කුලී නිදහස් කිරීමට යෝජිත අතර අනිකුත් ව්‍යාපෘතිවලට අදාළ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | අයකරගත යුතු සියලුම මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත් 24 කට අදාළව අත රඳවාගත් රු.18,449,500 ක් වූ රැඳවුම් මුදල් නිදහස් කළයුතු කාලය ඉක්මවා වසර 01 සිට වසර 04 දක්වා කාලයක් ගතවී තිබුණද, එම රැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ම නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට අදාළ රැඳවුම් මුදල් නිදහස් කිරීම සිදු කරනු ලබන්නේ අදාළ කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම්, ඉදි කරන ලද ගොඩනැගිලිවල තත්ත්වය පරීක්ෂා කර බලා අදාළ අංශ ප්‍රධානීන් හා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ නිර්දේශ මතය. එමෙන්ම අන්තර් බිල් ගෙවීම් කිරීමේදී ද අඩු කරන රුදවුම් මුදල් ගිණුම්ගත කර ඇත. කෙරීගෙන යන ව්‍යාපෘතිවලට අදාළව එම අඩු කරන ලද මුදලද මෙම ලේඛනය තුළ අඩංගුව ඇති බව | ගෙවිය යුතු රැඳවුම් මුදල් විධිමත් පරිදි නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | සියලුම අතිරික්ත මුදල්, මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව මිස ආයෝජනය කරනු නොලැබිය යුතු වුවද, විශ්වවිද්‍යාලය මඟින් සමාලෝචිත වර්ෂයේ අවස්ථා දෙකකදී එකතුව රු.21,000,000 ක මුදලක් අනුමැතිය ලබා ගැනීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | 2020 වර්ෂයේ සියලුම අතිරික්ත මුදල් භාවිතයට ගනිමින් ආරම්භ කරන ලද ස්ථාවර තැන්පතු සඳහා මුදල් ඇමතිවරයාගේ අනුමැතියට ලිපියක් යොමු කර ඇත. | සියලු අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් පනත සහ චක්‍රලේඛ විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත<br>15 (VI) වගන්තිය | එක් එක් උසස් අධ්‍යාපන ආයතනයන්ට වාර්ෂිකව ඇතුළත් කළයුතු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව හා එම ශිෂ්‍ය සංඛ්‍යාව එහි විවිධ පාඨමාලාවලට වෙන් කරන ආකාරය ඒ එක් එක් උසස් අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය විමසීමෙන් පසුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිශ්චය කළයුතු බව දක්වා තිබුණද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් ඉංජිනේරු පීඨයට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකර ගැනීම කෙරෙහි පසුගිය වසර 11 ක කාල පරිච්ඡේදය තුළම අවධානය යොමු කර නොතිබුණි. | බඳවා ගනු ලබන සිසුන් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා අනෙතුක් පහසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් ඉල්ලා ඇතත් මේ වන තෙක් ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබාදී නොමැත. | විශ්වවිද්‍යාල පනතේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1986 වර්ෂයේදී නිකුත් කරන ලද Schemes of Recruitmentand Procedurefor Appointment මාර්ගෝපදේශ සංග්‍රහයේ 24 වන මාර්ගෝපදේශය | තාවකාලික දේශකවරුන් බඳවා ගැනීමේදී අදාළ විෂය පිළිබඳ පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයන් සහිත උපාධියක් ලබා තිබිය යුතු වුවත්,සාමාන්‍ය සාමාර්ථයක් හා දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත උපාධි ලබාගත් දෙදෙනෙකු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ තාවකාලික දේශකවරුන් ලෙස බඳවාගෙන තිබුණි. | වර්තමානයේ මෙවැනි තත්ත්වයක් නොවන බව. | මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළයුතුය. |
| (ඈ) | 2011 අප්‍රේල් 20 දිනැති අංක 1/2011 දරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | පර්යේෂණවල ප්‍රගතිය සම්බන්ධයෙන් කාලීනව ඇගැයීම් කිරීමෙන් තොරව කළමනාකරණ පීඨයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 39 දෙනෙකු සඳහා මූලික වැටුපෙන් සියයට 35 ක පර්යේෂණ දීමනාවක් ගෙවා තිබුණි. | පර්යේෂණ දීමනාව සඳහා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ආයතන අංශයෙන් ලබා දෙන අයදුම්පතෙහි සඳහන් පරිදි එම දීමනා ගෙවීමට සාක්ෂි සපයා දීම හෝ පර්යේෂණ ප්‍රගතිය සමාලෝචනය කිරීම හෝ අනිවාර්ය බව ප්‍රකාශ නොවේ. කෙසේ වුවද, මින් ඉදිරියට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් සඳහා පර්යේෂණ දීමනා ගෙවීමට නිර්දේශ කිරීමේදී සඳහන් පරිදි අවශ්‍ය සාක්ෂි රැස්කිරීමට කටයුතු කරනු ඇති බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළයුතු වීම. |

(ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය
-------------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | 1.2.1 (ඇ) මාර්ගෝපදේශය | ජයතිලක නේවාසිකාගාරයේ අළුත්වැඩියා කටයුතුවලට අදාළ රුපියල් මිලියන 45.5 ක ඉංජිනේරු ඇස්තමේන්තුව පිළියෙල කළ ඉංජිනේරුවරයාම එම අළුත්වැඩියාව වෙනුවෙන් පත්කළ තාක්ෂණික ඇගැයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර තිබුණි. | එවකට පත්කර තිබූ ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස වැඩ ඉංජිනේරු පත් කර තිබුණි. වර්තමානය වන විට තාක්ෂණ ඇගයීම් කමිටු සඳහා වැඩ ඉංජිනේරුවරයාගේ පත් කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) අනුව සිදු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 7.9.2 (ක) මාර්ගෝපදේශය | ජයතිලක නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවට අදාළව ඉංජිනේරු ඇස්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තුව අතර අයිතම 52 ක් සම්බන්ධයෙන් සියයට 30 සිට සියයට 577 දක්වා විචලනයක් හෙවත් ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා රු.8,217,408 ක මිල ගණන් ඉදිරිපත් කර තිබුණද, තාක්ෂණික ඇගයීම් කමිටුව ඒ පිළිබඳ සළකා බැලීමකින් තොරව 2017 නොවැම්බර් 06 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. සංචලන අත්තිකාරම් වශයෙන් රු.14,039,397 ක් ගෙවා තිබූ අතර එනම් කාලය දීර්ඝ කිරීමෙන් පසු 2019 දෙසැම්බර් 31 දින වන විට අළුත්වැඩියා කටයුතු නිම කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම නිම කර නොතිබූ අතර රු.2,135,946 ක්වූ කාර්යසාධන ඇපකරය | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් අයිතමයන් වශයෙන් ඇගයීම් කර ඇත. ඒ අනුව එදිනට පැවති වෙළඳපොල මිල ගණන් හා සැසදීමේදී අඩුම මිල ගණන් ඉදිරිපත් කරන ලද ෆාම්හීල් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් සාධාරණ බවට තාක්ෂණික ඇගයීම් කමිටුව නිරීක්ෂණය කර ප්‍රදානය කිරීම සඳහා නිර්දේශ කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයරු.946,504,814 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.1,740,708,860 ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.794,204,046 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මහපොල ආධාර පර්යේෂණ ප්‍රදාන හා රජයේ ප්‍රදාන වැඩිවීමත් ගමන් වියදම් හා පෞද්ගලික පඩිනඩි වියදම් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්ව විද්‍යාලයේ සනාථන මන්දිරයේ ස්ථාපිත කර ඇති සරප් අංශය වෙත ලබාදී තිබූ රු.1,125,000 ක අග්‍රිමය සම්බන්ධ 2020 දෙසැම්බර් 02 වන දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී රු.255,153 ක මුදල් ඌනතාවයක් පැවතුණි. | මුදල් ඌනතාවය සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා, මේ වන විට ඒ සම්බන්ධ චෝදනා පත්‍ර ලබාදී ඇති අතර ඒ අනුව විධිමත් විමර්ශනයක් සිදු කෙරෙමින් පවතී. මෙම චෝදනාවට අදාළව හසු වූ සරප්වරයාගේ වැඩ තහනමට ලක් කර ඇත. | වංචා හා වැරදි වැළැක්වෙන පරිදි ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ඉංජිනේරු පීඨයේ දෙපාර්තමේන්තු 02 කට අයත් භාණ්ඩ සමීක්ෂණ අයිතමයන් 47 ක ඒකක 83 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රායෝගික ගැටළු හේතුවෙන් මේ සඳහා පත් කරන ලද සමීක්ෂණ මණ්ඩලය රැස්වීමට නොහැකි වූ හෙයින් නැවත සමීක්ෂණ මණ්ඩල රැස්වීමට කටයුතු කර අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඌනතාවය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ 2019 සැප්තැම්බර් 24 දිනැති අංක HE/EST/01/01/PDN දරන ලිපිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණියේ එක් පුරප්පාඩුවකට බඳවා ගැනීම වෙනුවෙන් අනුමැතිය ලැබී තිබුණද, ඒ සඳහා නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණි. තවද මෙම බඳවා ගැනීමට අදාළ ලිඛිත පරීක්ෂණය සඳහා ප්‍රශ්න පත්‍රය සකස් කර තිබුණේ එම ආරක්ෂක අංශයේම සේවය කර වර්තමානයේ ප්‍රධාන විනයාරක්ෂක ලෙස කටයුතු කරන නිලධාරියා බැවින් ඒ සඳහා ඔහුට ස්වාධීනත්වයක් නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම තනතුරට අදාළ පැවති ලිඛිත පරීක්ෂණය සඳහා අදාළ විෂය පිළිබඳ දැනුමක් ඇති පුද්ගලයෙකු පත් කළ යුතු අතර. ඒ අනුව ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී මහතා ලේඛකාධිකාරීගේ නිර්දේශය මත උපකුලපතිගේ අනුමැතියෙන් පත් කරන ලදි. විශ්වවිද්‍යාලය තුළ පවත්නා සීමිත මානව සම්පත් අදාළ ක්ෂේත්‍රයේ දැනුමද සළකා හැකි ඉක්මණින් බඳවා ගැනීම් සිදු කිරීමට භාවිතා කළ යුතු බැවින් එලෙස කටයුතු කරන ලදි. | බඳවා ගැනීම්වලට අදාළ විභාග පැවැත්වීමේදී ස්වාධීන පාර්ශවයන් ලවා ප්‍රශ්න පත්‍ර සැකසීම කළ යුතුය. |
| (ආ) | ඇස්තමේන්තුගත වටිනාකම එකතුව රු. 384,281,795 ක් වූ ව්‍යාපෘති 4 කට අදාළව සැලසුම් සකස් කිරීම සැලසුම් අනුමත කිරීම සහ පූර්ව ලංසු කැඳවීමේ කමිටුවේ සාමාජිකයෙකු ලෙස විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයෙකු කටයුතු කර තිබුණි. | පාලක සභාවේ අනුමැතිය මත කිසිදු මුදලක් නොගෙවා මෙම සේවා පාලක මණ්ඩල සාමාජිකයෙකු මඟින් ඉටු කර ගත් බව | පාලක මණ්ඩල සාමාජිකයෙකු විශ්වවිද්‍යාලය සම්බන්ධ ගිවිසුමකට ඍජුව හෝ වක්‍රව හෝ අන්‍යාකාරයකින් සබඳතාවයන් නොතිබිය යුතුය. |
| (ඇ) | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ඉංජිනේරු පීඨයේ පශ්චාත් උපාධි පාඨමාලා 07 ක් සඳහා සිසුන් 628 දෙනෙකු බඳවාගෙන ඒ සඳහා රු.166,550,000 ක පාඨමාලා ගාස්තුවක් අය කරගෙන තිබුණද, එම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | එම පාඨමාලා සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇත. | පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | විශ්වවිද්‍යාලය සතු වපසරිය රූඩ් 02, පර්චස් 33.5 වන ඉඩම් කොටස 1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම පේරාදෙණිය පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා නැවත නිදහස් කිරීමේ පදනම මත තාවකාලිකව පොලිස් දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණද, එම ඉඩම සම්බන්ධයෙන් බදු මුදලක් අයකර ගැනීමට හෝ එම ඉඩම පොලිස් දෙපාර්තමේන්තුවට පවරා දීමට අවශ්‍ය කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් සිදු කර නොතිබුණි. | මේ වන විට එම ඉඩමේ පේරාදෙණිය පොලිස් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති අතර එම ඉඩම පොලිස් දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලෙසට 2020 ජූනි 17 දිනැති ලිපිය මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් දැනුවත් කර ඇත. | පවරාදීමේ කටයුතු කඩිනමින් කිරීමටත් අයකරගත යුතු මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | විශ්වවිද්‍යාලය සතු වපසරිය රූඩ් 01, පර්චස් 15.56 ක් වන ඉඩම් කොටස 1997 වර්ෂයේ සිට සහ වපසරිය රූඩ් 02, පර්චස් 33.5 වන ඉඩම් කොටස 1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම පිළිවෙලින් ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සහ පොලිස් දෙපාර්තමේන්තුව භුක්ති විඳිමින් සිටියද එම දේපල සම්බන්ධයෙන් කිසිදු බදු මුදලක් අයකර ගැනීමට හෝ පවරා දීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම 1996 වර්ෂයේදී පමනක් කෙටි කාලීන පදනම මත ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාව වෙත සති පොළ පවත්වාගෙන යෑමට බදු පදනම මත ලබා දී තිබූ අතර 1997 වර්ෂයෙන් පසු ඒ සඳහා වලංගු බදු ගිවිසුකට එළඹ නොතිබුණි. එහෙත් මෑතකදී ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව මඟින් ඉඩමට අනවසරයෙන් ඇතුළු වී ඉඩම තුළ අනවසර වෙළඳ කුටි ඉදි කිරීමට කටයුතු කර ඇති අතර එයට විරුද්ධව මහනුවර මහ අධිකරණයේ අංක 226/19 යටතේ නඩුවක් ගොනු කර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් ඇත. | ඉඩම නැවත ලබාගෙන හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2020 දෙසැම්බර් 22 වන දින වැඩ දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කළ සේවකයින් 05 දෙනෙකු සහ එදින සේවයට වාර්තා නොකළ විදුලි කාර්මික ශිල්පියෙකු විශ්වවිද්‍යාලය සතු කැබ් රථයද යොදාගෙන විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාගේ පේරාදෙණියේ පිහිටි පුද්ගලික නිවසේ අළුත්වැඩියා සහ ඉදිකිරීමේ කටයුත්තකට යොදවාගෙන තිබුණි. එදින වැඩ දෙපාර්තමේන්තුවේ උපකරණ නිකුත් කිරීමේ ලේඛනය අනුව උපකරණ 15 ක් උක්ත ඉදිකිරීමේ කටයුත්තට | විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් ලේඛකාධිකාරීවරයා 2021 ජනවාරි 04 දින සිට මූලික පරීක්ෂණයක් කිරීමට යටත්ව නැවත දැනුම් දෙන තුරු අනිවාර්යය නිවාඩු යවා ඇත. තවද ඉහත විමර්ශන කමිටු වාර්තාව පදනම් කරගෙන පාලක සභාව විසින් අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ගරු නීතිපතිතුමාගේ උපදෙස් සඳහා ඉදිරිපත් කර ඇත. නීතිපති | සේවකයින් සේවයේ යෙදවීමේදී මනා අභ්‍යන්තර පාලක ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධ වූ සේවකයෙකුට නිකුත් කර තිබුණි. | උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව මෙම සිද්ධිය සම්බන්ධයෙන් පාලක සභාව විසින් අදාළ තීන්දු තීරණ ලබා දෙනු ලැබේ. | |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලය සඳහා ගිණුම් සහ සේවක වැටුප් ගෙවීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කර ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.7,514,311 ක මුදලකට පෞද්ගලික ආයතනයක් සමඟ 2017 වර්ෂයේ ගිවිසුම් ගතවී ඒ සඳහා 2018 වර්ෂය තුළ අවස්ථා දෙකකදී එකතුව රු.5,956,162 ක මුදලක් ගෙවා තිබුණි. අදාළ ගිවිසුම අනුව මෙම පරිගණක පද්ධතිය 2019 අප්‍රේල් 29 වන දිනට පෙර ස්ථාපිත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් පරිපාලන දෙපාර්තමේන්තුව සඳහා ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කිරීම හා ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් මේ වන විට සේවක කාර්ය මණ්ඩලය සඳහා ගිණුම්කරන මෘදුකාංග පද්ධතිය පිළිබඳ පුහුණුව ලබා දී ඇති අතර එක් එක් මොඩියුලර් (Modules) වල දත්ත පරිගණකයට ඇතුළත් කරමින් පවතී. එසේම කඩිනමින් මෙම පද්ධතිය මඟින් ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම්ගත කාල සීමාව තුළදී අදාළ සේවාවන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉංජිනේරු පීඨය වෙත පර්යේෂණ 09 ක් සඳහා රු.4,792,000 ක ප්‍රදාන මුදලක් ලබා දී තිබුණි. එයින් පර්යේෂණ 05 ක පර්යේෂණවල අවසන් වාර්තා ලබාදීමට නියමිත කාලය අවසන්වී වසර 01 සිට වසර 03 දක්වා කාලයක් ගතවී තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එම වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විමසුමෙහි සඳහන් පර්යේෂණ ප්‍රමාද වීමට හේතු දක්වමින් මෙම පර්යේෂණ නිම කිරීම සඳහා කාලය දිගු කිරීමක් ලබාදෙන ලෙස අදාළ පර්යේෂණලාභීන් විසින් සනාථන පර්යේෂණ කමිටුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබූ අතර ඒ සඳහා කමිටුවෙන් අනුමැතියද ලැබී තිබුණි. | පර්යේෂණ කටයුතු අවසන් වූ වහාම අදාළ පර්යේෂණ වාර්තා ලබාගත යුතුය. |
| (ඇ) | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවස්ථා කිහිපයකදී කාර්යය මණ්ඩලයට සහ ශිෂ්‍යයන් | විශ්වවිද්‍යාලය වසා තැබූ සහ පැමිණීමට සීමා කර තිබුණ කාල පරිච්ඡේදයන් සඳහා LEARN | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා විශ්වවිද්‍යාලය සම්පූර්ණයෙන්ම වසා තැබීම හා විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලය සඳහා පැමිණීම සීමා කර තිබුණි. ශිෂ්‍යයින් සඳහා සම්පූර්ණයෙන්ම වසා තැබූ දින 195 ක් හා කාර්යය මණ්ඩලය සඳහා වසා තැබූ දින 34 ක්ද, කාර්යය මණ්ඩලයේ පැමිණීම සීමා කර තිබූ දින 121 ක්ද යන තත්ත්වයන් නොසලකා අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා සම්පූර්ණ මාසික ගාස්තුව වන රු.3,845,887 බැගින් අදාළ ආයතනයට ගෙවීම් කර තිබුණි. | ආයතනය වෙත සම්පූර්ණ මාසික බිල්පත් ගෙවීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ NCSU හි අධ්‍යක්ෂවරයාගේ නිර්දේශ මත ගෙවා ඇත. මාසික බිල්පත් සහ එහි සංශෝධනයන් සම්බන්ධයෙන් (NCSU) ආයතනය මඟින් සහ සාමාන්‍ය සේවා අංශය මඟින් සිදු කරනු ලැබේ. | |
| (ඇ) | 2014 අප්‍රේල් 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව යටතේ Master Landscape Archeology උපාධි පාඨමාලාව ක්‍රියාත්මත කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් Freie Universitat Berlin අතර ගිවිසුමකට එලඹ තිබුණි. එම ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදීමට එකඟ වී තිබූ යූරෝ 33400 ක ගනුදෙනුවලට අදාළ කිසිදු මූල්‍ය වාර්තාවක් හෝ ලිපිගොනුවක් විගණනයට ඉදිරිපත් නොවූ අතර ව්‍යාපෘතියේ ගිවිසුම්ගත කාලපරිච්ඡේදය අවසන්වී වසර 04 ක කාලයක් ගතවී ඇතත් මේ දක්වාම Master Landscape Archeology උපාධි වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිවිසුමේ වගන්ති අංක 10, 11, 12 වගන්ති ප්‍රකාර වූ කරුණු නිවැරදි වේ. අදාළ මූල්‍ය වාර්තා ලිපිගොනු පිටපත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී මඟින් පරීක්ෂා කළ හැකිය. | පීඨ මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් විධිමත් පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඉ) | පුනරුත්තාපන ව්‍යාපෘති 19 ක (Rehabilitation) වැඩ ආරම්භ කිරීම සඳහා ඉකුත් වර්ෂවල දෙන ලද රු.2,235,939 ක් වූ අත්තිකාරම් ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 13 ක් ජර්නල් සටහන් මඟින් 2021 වර්ෂයේදී පියවා ඇති බවත් ඉතිරි ව්‍යාපෘතිවලට අදාළ ගෙවීම් ඉදිරිපත් කරනු ලබන බිල්පත්වලින් පියවා ගනු ලැබේ. | නියමිත කාර්යය නිම වූ විගස අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීම් ව්‍යාපෘති 15 කට අදාළව වැඩ ආරම්භ කිරීමට දී තිබූ අත්තිකාරම්වල නොපිය වූ ශේෂය රු.253,916,904 ක් විය. | ඉදිකිරීම් සඳහා දෙන අත්තිකාරම්වල අදාළ ලේඛන මූල්‍ය ප්‍රකාශන හා ලේඛන අඩංගු පොතෙහි පිටු 175 යටතේ දක්වා ඇත. | නොපියවූ අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂය අවසානයේදී රු.7,586,873 ක් වැය කර වැඩ අවසන් කරන ලද කලාගාරය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර 06 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පවතින අතර මේ වන විට ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකි ලෙස ගරා වැටී සිවිලිමද කඩා වැටී තිබුණි. | රු. මිලියන 82.2 ක ඇස්තමේන්තුව මත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආදී විද්‍යාර්ථයින්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය මගින් අරමුදල් සම්මාදම් කිරීම මත ක්‍රියාත්මක කිරීමට 2012 වර්ෂයේ සැලසුම් කළ පරිදි ඉන් කොටසක් සම්මාදම් වූ ආධාර මත ක්‍රියාත්මක කර 2014 ඔක්තෝබර් 24 දින නිම කර තිබුණි. නමුත් සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කර නොතිබීම මත අවසන් කාර්යය සඳහා භාවිතා කිරීමට නොහැති තත්ත්වයක පවති. කෙසේ වුවද ආදි විද්‍යාර්ථයින්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය මගින් සම්පාදිත ප්‍රතිපාදන මත කිහිපයක් ක්‍රමානුකූලව ඉදි කිරීමට සැලසුම් කර අති අතර සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් වූ පසුව අදාළ කාර්යය සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇත. | ගොඩනැගිලි ඉදිකිරීමේදී විධිමත් ඇගැයීමක් සහිතව ප්‍රශස්ත උපයෝජනයක් කළ හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ආ) | Establishment of a Foundation Grant for Annual Awards for Research Excellence වැඩසටහන සඳහා 2017 අගොස්තු 04 වන දින මහාචාර්යවරයෙකුගෙන් ලද රු.1,500,000 ක මුදල 2020 දෙසැම්බර් 31 වන දින දක්වා අදාළ කාර්යය සඳහා නොයොදවා විවිධ තැන්පතු යටතේ දක්වා, 2020 දෙසැම්බර් 31 දින විශ්ව විද්‍යාල පර්යේෂණ අරමුදලට මාරුකර තිබුණි. | මෙම අරමුදල් ශේෂයන් විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව මගින් ඵලදායීව උපයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී කිරීමට නියමිතව ඇත. | පර්යේෂණ අරමුදල් නියමිත කාලසීමාව තුළ ප්‍රශස්ත අයුරින් උපයෝජනය කළ යුතුය. |

**3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| "National Survey on Persistent Organic Pollutant in Breast Milk" පර්යේෂණ ව්‍යාපෘතිය අනුව මව් කිරිවල කාබනික දූෂ්‍යකාරක අඩංගු දැයි පරීක්ෂා කිරීමට අදාළව දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි සාම්පල් පර්යේෂණ කටයුතු සඳහා චීනයට යැවීම සහ එහි ප්‍රතිඵල විග්‍රහ කර පර්යේෂණ වාර්තාව පිළියෙල කිරීමේ වගකීම විශ්වවිද්‍යාලය වෙත පැවරී තිබුණද, ගිවිසුම්ගත කාලය ඉක්මවා මාස 09 ක් ගතවී තිබුණද එම කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කිසිවක් වාර්තාවේ දිනය දක්වාම ඉටුවී නොතිබුණි. | The project will be completed within this year and the report will be submitted to the Ministry. | ගිවිසුම්ගත කාල සීමාව තුළ ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විශ්වවිද්‍යාලයේ ජයතිලක නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීම සඳහා රු.49,126,740 ක මුදලකට 2017 නොවැම්බර් 09 වන දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී අළුත්වැඩියා කටයුතු සිදු කර තිබුණද, නිවැරදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.6,390,671 ක් වටිනා අළුත්වැඩියා කටයුතු වැඩ දෙපාර්තමේන්තුව මඟින් සෘජු ශ්‍රමය යටතේ ඉටු කිරීමට සිදුවී තිබුණි. | 2016 වර්ෂයේදී එවකට පැවති අවශ්‍යතාවය අනුව ඇස්තමේන්තු පිළියෙල කර රු. මිලියන 45.55 ක් ජයතිලක ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන් කර ඇත. එම මුදල් සීමාව තුළ එවකට පැවති ප්‍රධාන සහ අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තු පිළියෙල කර ඇත. | නිවැරදි ඇස්තමේන්තු අනුව ප්‍රමාණවත් ඇගැයීමක් හා අධීක්ෂණයක් යටතේ සියලු ඉදිකිරීම් සිදු කළ යුතුය. |
| (ආ) | ජයතිලක නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීම සඳහා 2017 නොවැම්බර් 06 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී ඒ සඳහා රු.14,039,397 ක මුදලක් සංචලන අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණද අළුත්වැඩියාව සඳහා කොන්ත්‍රාත්කරු වෙත වැඩ බිම භාර දී තිබුණේ අත්තිකාරම් ගෙවා මාස 06 කට පසුව 2018 මැයි මස 03 වන දින දීය. | ජයතිලක ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරගෙන යන අතරතුර වැසිකිලි පද්ධති ආශ්‍රිත කොන්ක්‍රීට් තට්ටුවල බදාම තට්ටු ගැලවී යාමක් සිදු විය. අදාළ ස්ලැබ් ඉවත් කොට අළුතින් දැමීම සඳහා මිල ගණන් කැඳවා අඩුම මිල ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කිරීම හේතුවෙන් ජයතිලක ශාලාවේ ඉතිරි ප්‍රතිසංස්කරණ කොටස් නිම | විශ්වවිද්‍යාලය තුළ සිදු කරනු ලබන සියලු ඉදිකිරීම් ප්‍රමාණවත් ඇගැයීමක් හා අධීක්ෂණයක් මඟින් පමණක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කිරීමේ කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු වී ඇත. | |
| (ඇ) | ජයතිලක නේවාසිකාගාරයේ අළුත්වැඩියා කටයුතු කාලය දීර්ඝ කිරීමෙන් පසු 2019 දෙසැම්බර් 31 දින වන විට වැඩ නිම කළයුතු වුවත්, එහි කටයුතු 2020 දෙසැම්බර් 31 දින දක්වාම නිම කර නොතිබූ අතර ඊට සාපේක්ෂව රු.2,135,946 ක් වූ කාර්යසාධන ඇපකරය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි. | අදාළ කොන්ත්‍රාත්කරුගේ වගකීමෙන් බැහැරව කිරීමට සිදු වූ අළුත්වැඩියා කටයුතු හේතුවෙන් නියමිත කාලසීමාවෙන් ඔබ්බට කාර්යසාධන බැදුම්කරය දීර්ඝ කර නැත. කෙසේ වුවද මේ වන විට සියලු වැඩ නිම කර විශ්වවිද්‍යාලය වෙත භාරදී ඇත. | විශ්වවිද්‍යාලය තුළ සිදු කරනු ලබන සියලු ඉදිකිරීම් ප්‍රමාණවත් ඇගැයීමක් හා අධීක්ෂණයක් මඟින් පමණක් සිදු කළ යුතුය. |
| (ඈ) | ජයතිලක නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීමට අදාළව වැඩ ඉංජිනේරු විසින් සහතික කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුව හා එය සකස් කිරීම සඳහා පදනම් කරගත් මිල විශ්ලේෂණයන් හා ඊට අදාළ මිනුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු සහ මිල විශ්ලේෂණයන් සහ අදාළ මිනුම් විස්තර වැඩ ඉංජිනේරු කාර්යාල කාමරයේ තිබූ අතර දැනට ඒවා අස්ථානගතවී ඇත. | ඇස්තමේන්තු සැකසීමට අදාළ සියලු තොරතුරු ලබා දිය යුතුය. |
| (ඉ) | විජේවර්ධන නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීම සඳහා රු. මිලියන 240.51 කට 2018 අප්‍රේල් 18 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගතවී 2018 මැයි මස සංචලන අත්තිකාරම් වශයෙන් රු.40,017,474 ක මුදලක් ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු වෙත වැඩ බිම භාර දී තිබුණේ ගිවිසුම්ගත වී මාස 09 කට පසුව එනම් 2019 පෙබරවාරි 08 දිනදීය. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයට පෙර නේවාසිකාගැර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත දැනුම් දී ඇත. කෙසේ වුවද මෙහිදි ශිෂ්‍යයාවන්ගේ නේවාසික ගැටලු හේතුවෙන් පැන නැගුන විරෝධය මත අදාළ නේවාසිකාගාරය අළුත්වැඩියා කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු වෙත භාර දීමට ප්‍රමාද වී ඇත. | විශ්ව විද්‍යාලය තුළ සිදු කරනු ලබන සියලු ඉදිකිරීම් ප්‍රමාණවත් ඇගැයීමක් හා අධීක්ෂණයක් මඟින් පමණක් සිදු කළ යුතුය. |
| (ඊ) | අරුණාචලම් නේවාසිකාගාරයේ අළුත්වැඩියා කිරීම සඳහා 2018 ජනවාරි 08 දින රු. මිලියන 45.18 ට කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී 2019 ජූලි මාසයේදී සංචලන අත්තිකාරම් වශයෙන් රු.7,102,351 ක මුදලක් ගෙවා වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද වැඩ ආරම්භ කිරීම සඳහා වැඩබිම කොන්ත්‍රාත්කරු වෙත භාරදී නොතිබුණි. | ජයතිලක හා අරුණාචලම් යන ශාලා එකවර ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබූ බව, ජයතිලක ශාලාවේ අළුත්වැඩියා කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ශිෂ්‍යයන් පදිංචි කිරීමට නොහැකි වී ඇති බවත්, එබැවින් අරුණාචලම් ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් සංචලන අත්තිකාරම් බැදුම්කරය 2021 මැයි දක්වා දීර්ඝ කර ඇත. | විශ්ව විද්‍යාලය තුළ සිදු කරනු ලබන සියලු ඉදිකිරීම් ප්‍රමාණවත් ඇගැයීමක් හා අධීක්ෂණයක් මඟින් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයෙහි 2020 වර්ෂය සඳහා වූ අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය, තත්‍ය කාර්යය මණ්ඩලය සමඟ සැසඳිමේදී පිළවෙලින් 244 ක් සහ 269 ක් පුරප්පාඩුව පැවතුණි. මෙම තත්ත්වය විශ්වවිද්‍යාලයෙහි කටයුතු කාර්යක්ෂමව හා ප්‍රශස්තව පවත්වාගෙන යාම කෙරෙහි බලපෑ හැකි බැවින් පුරප්පාඩු තනතුරු සඳහා කාර්යය මණ්ඩලය බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව පැවතුණි. | විශ්වවිද්‍යාලය අනධ්‍යයන කාර්යය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු 259 බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත්, අධ්‍යයන කාර්යය මණ්ඩලයෙහි පවතින පුරප්පාඩු 244 ක් 2021 වර්ෂයේදී පිරවීම සඳහා පුවත්පත් දැන්වීමක් පල කරන ලද අතර ඉදිරියේදී එම බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට නියමිත බව. | විශ්වවිද්‍යාලයේ කටයුතු ප්‍රශස්තව පවත්වාගෙන යාම සඳහා අනුමත කාර්යය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |